WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**15 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

| | |
|---|---|
| **ක්‍රිස්තියානි ධර්මය** | **I, II** |
| கிறிஸ்தவம் | **I, II** |
| Christianity | **I, II** |

## ක්‍රිස්තියානි ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) "අපට දරුවෙක් උපන්නේ ය. ......... එතුමාණන් අසිරිමත් උපදේශකයාණෝ ය. සාමයේ කුමාරයාණෝ යැයි කියනු ලබන්නෝ ය." ජේසුස් වහන්සේ ගැන මෙම අනාවැකිය ප්‍රකාශ කළේ කුමන දිවැසිවරයා ද? මෙම අනාවැකිය පූර්ණ වූයේ කවුරුන් තුළින් ද?

(ii) පහත සඳහන් දේව ප්‍රකාශ ඉදිරිපත් කෙරුණේ කුමන අවස්ථාවලදී ද?

(අ) "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි."

(ආ) "මේ මාගේ පුත්‍රයාණෝ ය. මා තෝරාගත් තැනැත්තාණෝ ය. මොහුහට සවන් දෙන්න."

(iii) (අ) ජුදෙව් පාස්කු මංගල්‍යය මගින් ඔවුන් සමරන්නේ කුමන සිද්ධියක් ද?

(ආ) කිතුනු පාස්කුව වැදගත් වන්නේ කෙසේ ද?

(iv) මරණය අභිබවා ජේසුස් වහන්සේ ආශ්චර්ය ක්‍රියා කර, නව ජීවිතයක් උදාකර දුන් අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(v) ජේසුස් වහන්සේ කුරුසියේ දිවි පිදූ අවස්ථාවේදී සොබා දහම දැක්වූ පුදුමාකාර ප්‍රතිචාර **දෙකක්** ලියන්න.

(vi) (අ) සමාජයේ සාධාරණයක් ගෙනඒමට ස්නාවක ජොහාන් ඉදිරිපත් කළ අභියෝගය කුමක් ද?

(ආ) මුල් කිතුනු සභාව සමාජ සාධාරණත්වය ස්ථාපිත කිරීමට ක්‍රියා කළේ කෙසේ ද?

(vii) සේවක නායකත්වයේ ගුණාත්මක බව ඉස්මතු කර දැක්වීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ අවස්ථා **දෙකක්** ලියන්න.

(viii) කමාවීමේ වැදගත්කම දැක්වීමට ජේසුස් වහන්සේ ක්‍රියා කළ අවස්ථා **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ix) "මනුෂ්‍යයෙනි, ඔබ මේ දේවල් කරන්නේ මන් ද? අපිත් ඔබ හා සමාන මිනිසුන් ය."

(අ) මෙසේ පාවුල්තුමා ජනතාවට ප්‍රකාශ කළේ කුමන නගරයේදී ද?

(ආ) එමගින් කිතුනු සේවකයනට ප්‍රදානය කරන පණිවුඩය කුමක් ද?

(x) "යමෙක් **නැවත නූපන්නොත්** ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැකගත නොහැක."

(අ) ජේසුස් වහන්සේ මෙසේ කීවේ කා හට ද?

(ආ) මෙහි තද කළු අකුරින් ලියවී ඇති පදයෙන් කුමක් අවධාරණය කළ සේක් ද?

**2.** "ස්වාමිනී වෙහෙස නොවන්න, ඔබ මාගේ පියස්ස යටට වැඩමවා ගැනීමට මම නොවටිමි. .........."

(i) මෙසේ පැවසුවේ කවුරුන් විසින් ද? ඔහු කෙබඳු තත්ත්වයක් දැරූ කෙනෙක් ද?

(ii) මෙයට පසුබිම් වූ අවස්ථාව ලුහුඬින් විස්තර කරන්න.

(iii) ඉහත සඳහන් ප්‍රකාශය මගින් අපට අනුගත කරගත හැකි එම පුද්ගලයාගේ විශේෂ චරිත ලක්ෂණ හා ජේසුස් වහන්සේ විසින් ඉස්මතු කළ ගුණාංගය පහදන්න.

**3.** 'කාන්තා විමුක්ති පෙරමුණ' අද ලොව බොහෝ රටවල උද්ගතව ඇති සංදර්භයකි.

(i) එවකට ජුදා සමාජයේ කාන්තාවන්ගේ තත්ත්වය කෙබඳු වී දැයි පෙන්වීමට සාධක **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ii) ජේසුස් වහන්සේ කාන්තාවන්ට සමාජයේ නිසි තැනක් හිමිකර දීමට ගත් පියවර **තුනක්** ලුහුඬින් ලියන්න.

(iii) ශ්‍රී ලාංකික සමාජයේ කාන්තා අයිතිවාසිකම් නගා සිටුවීමට ජේසුස් වහන්සේගේ ආදර්ශය අනුව කිතුනුවන් ගත යුතු ක්‍රියාමාර්ග **පහක්** විස්තර කරන්න.

[ හත්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**4.** (i) පාවුල්තුමාගේ නව ජීවිත පරිවර්තනය හුවා දක්වන සාක්ෂි කවරේ ද?

(ii) එතුමාගේ ජීවිත පසුබිම ඔහුගේ ධර්ම දූත සේවයේ ද පිටිවහලක්වූ අවස්ථා **තුනක්** උදාහරණ සහිතව පහදන්න.

(iii) පාවුල්තුමාගේ ජීවිතය හා සේවය මගින් අද කිතුනු අප අනුගත කළ යුතු වටිනා ලක්ෂණ කවරේදැයි විස්තර කරන්න.

**5.** "ගැලවීම අද මේ ගෙදරට පැමිණ ඇත. ............ මනුෂ්‍ය පුත්‍රයාණෝ නැතිවූ දේ සොයන්නටත් ගලවන්නටත් වැඩම කළ සේක."

(i) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කාගේ නිවසේදී ද? පසුබිම වූයේ කුමන අවස්ථාවක් ද?

(ii) නැතිවූවන් සෙවීමට හා ගළවා ගැනීමට ජේසුස් වහන්සේ ක්‍රියා කළ අවස්ථා **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) ඔබේ නොමග ගිය මිත්‍රයකු යහමගට ගෙන ඒමට ජේසුස් වහන්සේගේ සේවයේ මාර්ග පදනම් කරගෙන ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** විස්තර කරන්න.

**6.** "අප ජීවත් වන ලොවෙහි අසාධාරණය රජ කරයි."

(i) "යුක්තිය ගලා බසින දිය දහරක් මෙන් ද ධර්මිෂ්ටකම නොසිඳී ගලන ගඟක් මෙන් ද පැවතිය යුතු ය." මෙසේ පැවසූ දිවැසිවරයා නම් කර, ඔහු අපේක්ෂා කළ සමාජ පරිවර්තනය කෙබඳු වී දැයි ඉදිරිපත් කරන්න.

(ii) ජේසුස් වහන්සේ මෙලොවට වැඩම කළ සමාජය තුළ යුක්තිය පසිඳලීමට මැදිහත් වූයේ කෙසේ දැයි උදාහරණ **තුනක්** මගින් පහදන්න.

(iii) ඔබ ජීවත් වන සමාජයේ දක්නට ඇති විවිධ අසාධාරණකම් තේරුම් ගනිමින් යුක්තිය හා සාධාරණත්වය ස්ථාපිත කිරීමට ක්‍රියා කළ යුත්තේ කෙසේ දැයි යෝජනා **පහක්** ලියා දක්වන්න.

**7.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන බයිබලයෙන් උදාහරණ සහිත ව ලුහුඬු සටහන් ලියන්න.

(i) ආගන්තුක සත්කාරය

(ii) බහුවිධ සමාජයේ සමගියට කැපවෙමු.

(iii) පාවුල්තුමා විසින් ප්‍රේමය පිළිබඳ ඉදිරිපත් කර ඇති ඉගැන්වීම්

(iv) දුක්විඳීම පිළිබඳ ජේසුස් වහන්සේ ස්ථාපනය කළ නව ආකල්පය

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....